**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 07/95**

මගේ අංකය: III/140/එල්/98 ටී/16
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07
1995.02.22 වෙනි දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා සභාපති වරුන් වෙත.

**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 264 හා 6/88**
**<u>සංශෝධනය කිරීම</u>**

1984.08.15 දිනැති අංක 264 හා 1988.02.11 දිනැති අංක 6/89 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛවල සඳහන් වන නිලධාරීන්ට අමතරව කැබිනට් අමාත්‍යාංශවල "ප්‍රධාන ගණකාධිකාරී" වශයෙන් විධිමත්ව පත් කරනු ලැබ ඇති ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ 1 පන්තියේ නිලධාරීන්ට ද එකී චක්‍රලේඛවල සඳහන් පරිදි රජයේ වාහන පෞද්ගලික කාර්යයන් සඳහා පාවිච්චි කිරීමේ අනුග්‍රහය ලබාදීමට රජය තීරණය කර ඇත. මෙම අනුග්‍රහය කැබිනට් අමාත්‍යාංශයක "ප්‍රධාන ගණකාධිකාරී" තනතුර දරණ තාක් කල් හිමි වේ.

03. අංක 264 හා 6/88 දරණ චක්‍රලේඛ වල සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතිනු ඇත.

04. මෙම විධිවිධාන 1995.01.11 දින සිට ක්‍රියාත්මක විය යුතුය.

අ.කලේ/(**ආර්.එස්.ජයරත්න**)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
වැවිලි කර්මාන්ත හා පාර්ලිමේන්තු
කටයුතු අමාත්‍යාංශය